" විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා අැප කැපවෙමු "

ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / பொதுத் தொலைபேசி / General Telephone - 011 - 2093000

SLSI ISO 9001 SYSTEM CERTIFIED

SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இலக்கம் / My No. | CSWP/ADM/18-38/FI/05(A) | ඔබේ අංකය / உமது இலக்கம் / Your No. | | දිනය / திகதி / Date | 2022.10. |

පාලන චක්‍රලේඛ : **10/2022**

ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාරවර කාර්යාලය(බ.ප.),
සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය (බ.ප.),
ලේකම්,රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.),
සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්, (බ.ප.),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/පිරිස් හා පුහුණු/මූල්‍ය/සැලසුම්/ඉංජිනේරු),
පළාත් ආදායම් කොමසාරිස්,ආදායම් දෙපාර්තමේන්තුව(බ.ප.),
අධ්‍යක්ෂ,අභ්‍යන්තර විගණන ඒකකය (බ.ප.),
ප්‍රධාන නීති නිලධාරි,නීති ඒකකය (බ.ප.),
ප්‍රධාන ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්/පරිපාලන නිලධාරී,

<u>ජ්‍යෙෂ්ඨත්වයට හා විශ්‍රාම වැටුපට හානියක් නොවන පරිදි රාජ්‍ය නිලධාරීන්ට දේශීය / විදේශීය වැටුප් රහිත නිවාඩු ලබා ගැනීම.</u>

උක්ත ශීර්ෂය යටතේ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් විසින් 2022.09.15 දිනෙන් යුක්තව නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 14/2022(II) දරණ චක්‍රලේඛයෙහි 4.14 ඡේදයට අනුකූලව පහත උපදෙස් දක්වා සිටිමි.

01. යථෝක්ත චක්‍රලේඛයෙහි සඳහන් උපදෙස් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවය සඳහා අදාළ කර ගැනීමට 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ 32 වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව බස්නාහිර පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමැතිය ලබා දී ඇති අතර, ඒ බව මාගේ අංක CSWP/ADM/18-38/FI/01-2022 හා 2022.09.30 දිනැති ලිපිය මඟින් දැනටමත් දැනුම් දී ඇත.

02. ඒ අනුව බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තනතුරක් දරණ නිලධාරීන් හා සේවකයන් ඉහත කී රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 2022.06.22 දිනැති අංක 14/2022 චක්‍රලේඛයද, 2022.09.06 දිනැති 14/2022(I) චක්‍රලේඛය ද, 2022.09.15 දිනැති 14/2022(II) චක්‍රලේඛය ද, අදාළ කර ගනිමින් දේශීය වැටුප් රහිත නිවාඩු අයදුම් කිරීමේදී හා ඊට අදාළ නිවාඩු අනුමත කිරීම සම්බන්ධයෙන් යථෝක්ත චක්‍රලේඛයන් යටතේ ලබා දී ඇති උපදෙස් හා මෙම චක්‍රලේඛය යටතේ විශේෂයෙන් සඳහන් කර ඇති කාරණාවන්ට යටත්ව අදාළ කර ගනිමින් කටයුතු කිරීමට ක්‍රියා කල යුතුය.

03. ඒ අනුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 14/2022(II) චක්‍රලේඛයෙහි 3.1 සහ 3.2 යටතේ උපදෙස් අනුව කටයුතු කිරීම පාලන චක්‍රලේඛ අංක 09/2022 චක්‍රලේඛයෙහි සඳහන් (05) වන ඡේදයට අනුව පත්කරන ලද කමිටුව යටතේ කඩිනමින් සිදුකල යුතු අතර, එසේ කටයුතු කිරීමෙන් පසු

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 14/2022(II) 3.3 හි සඳහන් සේවා ගණයන් හා තනතුරු හඳුනාගැනීම පූර්වයෙන් සිදුවිය යුතුය.

04. එලෙස අදාල චක්‍රලේඛයෙහි 3:3 ඡේදය යටතේ හඳුනාගත් සේවා ගණයන්ට හා තනතුරු සඳහා ඒ ඒ අමාත්‍යාංශය මගින් පත් කරන ලද කමිටුව මගින් ලබාදෙන නිර්දේශයන්ට අනුව නිවාඩු අනුමත කිරීම සිදු කල යුතුය.

05. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 14/2022(II) හි අමාත්‍යාංශ ලේකම් හැඳින්වීමට බස්නාහිර පළාතේ ප්‍රධාන ලේකම්, බස්නාහිර පළාත් අමාත්‍යාංශ ලේකම්වරුන්, බස්නාහිර පළාත් ආණ්ඩුකාර ලේකම්, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්, බස්නාහිර පළාත් සභා ලේකම් යන හැඳින්වීම ආදේශ විය යුතු අතර, එහි සඳහන් අමාත්‍යාංශ කමිටුව යන්නට පාලන චක්‍රලේඛ අංක 09/2022 (05) ඡේදය යටතේ විස්තර කරනු ලබන කමිටුව අදහස් විය යුතුය.

06. නිවාඩු අනුමැතිය ලද නිලධාරියාගේ නිවාඩු කාලසීමාව තුළ ලිපි ගනුදෙනු සඳහා අදාළ විය යුතු ලිපිනයන් ගිවිසුම්ගත වීමට පෙර නිසි පරිදි තහවුරු විය යුතු අතර, එම ලිපිනයන් සම්බන්ධව පසුව සිදුවන සංශෝධනයන් වන්නේ නම් ඒ බව සේවා ස්ථානය වෙත දැනුම් දිය යුතුය.

07. තවද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 2022.06.22 දිනැති අංක 14/2022 චක්‍රලේඛය ද, 2022.09.06 දිනැති 14/2022(I) චක්‍රලේඛය ද, 2022.09.15 දිනැති 14/2022(II) චක්‍රලේඛය ද මගින් ලබාදෙන උපදෙස් යටතේ දේශීය වැටුප් සහිත නිවාඩු අනුමත කරන සෑම අයකු සම්බන්ධයෙන්ම නිවාඩු අනුමත කිරීමට පූර්වයෙන් මෙම චක්‍රලේඛයේම කොටසක් ලෙස ඉදිරිපත් කරන ඊට අදාළ ගිවිසුමට නිවාඩු අනුමත කරන බලධාරීත්වය හා නිවාඩු අයදුම්කරු ලෙස ඇතුළත් විය යුතුය.

08. තවද, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 14/2022(II) චක්‍රලේඛයේ 07 වන ඡේදයේ සඳහන් උපදෙස් සමඟ බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්යය පටිපාටි රීති සංග්‍රහයේ 12වෙනි පරිච්ඡේදය මෙන්ම පාලන චක්‍රලේඛ අංක 09/2022 දරණ චක්‍රලේඛයද අවස්ථාවෝචිත පරිදි අදාළ විය යුතු බව වැඩිදුරටත් දන්වමි.

ජේ.එම්.සී.ජයන්ති විජේතුංග,
ප්‍රධාන ලේකම්,
බස්නාහිර පළාත.

<u>ගිවිසුමයි.</u>

මෙහි පහත ඇතැම් තැනක "පළමු පාර්ශවය" ලෙස හඳුන්වනු ලබන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බස්නාහිර පළාතේ .................................................................(ප්‍රධාන ලේකම්/අමාත්‍යාංශයේ ලේකම්) වන ............................................. යන අය (අනුප්‍රාප්තිකව එම තනතුරට ස්ථිරව හෝ වැඩ බැලීම සඳහා පත්වන අයද සමග) එක් පක්ෂයකට ද, මෙහි ඇතැම් තැනක "දෙවන පාර්ශවය" ලෙස හඳුන්වනු ලබන ................................................ (අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ නම) සේවය කරන බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ................................................................................................ තනතුරක් දරණ ...................................................................................................................................................

යන ලිපිනය ඇති ................................................... යන අය අනෙක් පාර්ශවය වශයෙන්ද ඇති කරගන්නට යෙදෙන ගිවිසුමයි.

ඉහත කී දෙවන පාර්ශවය විසින් රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කළ 2022.06.22 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 14/2022 ද, 2022.09.06 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 14/2022(I), 2022.09.15 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 14/2022(II) යන චක්‍රලේඛයන්හි විධිවිධාන ප්‍රකාරව ජ්‍යෙෂ්ඨත්වයට හා විශ්‍රාම වැටුපට හානියක් නොමැතිව දේශීය වැටුප් රහිත නිවාඩු පළමු පාර්ශවය වෙතින් ඉල්ලුම් කිරීමට අපේක්ෂා කර ඇති හෙයින්ද, එකී පළමු පාර්ශවය වෙතින් ඉහත කී රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 14/2022, 14/2022(I) හා 14/2022(II) චක්‍රලේඛයන්හි විධිවිධානයන්ට අනුකූලව කරනු ලබන ඉල්ලීමකදී, ඊට අදාළව ඉල්ලුම්කරුගේ ජ්‍යෙෂ්ඨත්වයට හා විශ්‍රාම වැටුපට හානියක් නොවන පරිදි වැටුප් රහිත නිවාඩු ලබා දීමට පළමු පාර්ශවය එකඟ වන හෙයින් දේශීය නිවාඩු කාල සීමාව තුළ ඉහත කී රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 14/2022, 14/2022(I) හා 14/2022(II) චක්‍රලේඛයන්ට අනුකූලව දෙපාර්ශවය අතර කටයුතු පවත්වාගෙන යාම පිළිබඳව එකී දෙපාර්ශවය විසින් පහත කොන්දේසි සහ බැඳීම්වලට යටත්ව මෙම ගිවිසුමට ඇතුළත් වේ.

ඉහත කී කොන්දේසි සහ බැඳීම් කවරේද යත්;

1. රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය ලේකම් විසින් නිකුත් කළ 2022.06.22 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 14/2022, 2022.09.06 දිනැති 14/2022(I), 2022.09.15 දිනැති 14/2022(II) යන චක්‍රලේඛයන්(මෙහි මින් මතු රා.ප.ච.අංක 14/2022, 14/2022(I) හා 14/2022(II) යනුවෙන් හඳුන්වන) මෙම ගිවිසුමෙහි කොටසක් වශයෙන් පිළිගනිමින් එකී චක්‍රලේඛයන්හි කොන්දේසි හා නියමයන්ට අනුකූලව මෙම ගිවිසුම තුළ එකඟ වන නිවාඩු කාලසීමාව තුළ කටයුතු කිරීමට දෙපාර්ශවයම එකඟ වෙයි.

2. රා.ප.ච. අංක 14/2022, 14/2022(I) හා 14/2022(II) චක්‍රලේඛයන් යටතේ දෙවන පාර්ශවය විසින් දේශීය නිවාඩු අයදුම් කිරීමේදී සහ පළමු පාර්ශවය විසින් ඊට අදාළ දේශීය නිවාඩු අනුමත කිරීමේදී රා.ප.ච. අංක 14/2022, 14/2022(I) හා 14/2022(II) චක්‍රලේඛයන්හි සඳහන් විධිවිධාන ඊට අදාළ රජයේ ආයතන සංග්‍රහයේ විධිවිධාන, බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කාර්ය පටිපාටි රීති මඟින් නියම කරන විධිවිධාන හා සමාන්තරව ක්‍රියාත්මක විය යුතු බව දෙපාර්ශවය පිළිගනියි.

3. පළමු පාර්ශවය විසින් දෙවන පාර්ශවය වෙත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022(II) යටතේ දේශීය වශයෙන් වැටුප් රහිත නිවාඩු අනුමත කිරීමේ දී, ඉහත කී දෙවන පාර්ශවය රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022(II) හි 3.3 ඡේදයට අනුව, අදාළ චක්‍රලේඛය යටතේ වැටුප් රහිත නිවාඩු සඳහා හිමිකම් ඇති සේවකයන් හා තනතුරු දරණ අයෙකු වන්නේ ද යන්න පිළිබඳව හඳුනාගැනීමට පත් කරන කමිටුව විසින් තෝරා ගත් පාර්ශවයක් බව දෙපාර්ශවය පිළිගනී.

4. රා.ප.ච.අංක 14/2022, 14/2022(I) හා 14/2022(II) යටතේ අනුමත දේශීය නිවාඩු කාල සීමාව තුළ එම චක්‍රලේඛයන්හි උපදෙස් හා නියමයන්ට යටත්ව සෑම විටම ක්‍රියා කිරීමට දෙවන පාර්ශවය එකඟ වේ.

5. දෙවන පාර්ශවය විසින් මෙම ගිවිසුමට අදාළ දේශීය නිවාඩු කාල සීමාව තුළ රා.ප.ච.අංක 14/2022 14/2022(I) හා 14/2022(II) චක්‍රලේඛයන්හි උපදෙස්, කොන්දේසි හෝ නියමයන් නොසලකා හරිමින් හෝ පැහැර හරිමින් හෝ කඩකරමින් කටයුතු කර ඇති බව තහවුරු වන කවර හෝ අවස්ථාවක දෙවන පාර්ශවයට අදාළ රා.ප.ච.අංක 14/2022, 14/2022(I) හා 14/2022(II) චක්‍රලේඛයන් යටතේ හිමිවූ බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ජ්‍යෙෂ්ඨත්වයට හා විශ්‍රාම වැටුපට අදාළ හිමිකම් සම්බන්ධයෙන් හෝ එම චක්‍රලේඛයන් යටතේ හිමිවූ වෙනත් කවර හෝ හිමිකමක් සඳහා තමන්ට අයිතිවාසිකමක් නොමැති බව දෙවන පාර්ශවය පිළිගනියි.

6. දෙවන පාර්ශවය දේශීය නිවාඩු කාල සීමාව තුළ බස්නාහිර පළාත් රාජ්‍ය සේවයෙන් බැහැරව සිටින කාල සීමාවේදී රා.ප.ච.අංක 14/2022, 14/2022(I) හා 14/2022(II) චක්‍රලේඛයන්ට අනුව නිවාඩු අනුමත කරන දිනට හිමි මූලික වැටුපට අදාළ වැන්දඹු අනත්දරු/ වැන්දඹු පුරුෂ දායක මුදල් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙත ප්‍රේෂණය කිරීමේදී ඊට අදාළ තහවුරුවක් පළමු පාර්ශවයට යොමු කිරීමට දෙවන පාර්ශවය එකඟ වන අතර, ඒ හා සම්බන්ධයෙන් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ විසින් කලින් කල ලබා දෙන උපදෙස් අනුව කටයුතු කිරීමට දෙවන පාර්ශවය එකඟ වෙයි.

ඉහත කී කොන්දේසීන්ට යටත්ව පහත නම් සඳහන් සාක්ෂිකරුවන් ඉදිරියේ ඉහත කී දෙපාර්ශවය විසින් මෙම ගිවිසුමට හා මේ හා සමාන තවත් ගිවිසුමකට වර්ෂ ................ ක් වූ ............................. මස ............දින .......................... දී අත්සන් තබන ලදී.

**පළමු පාර්ශවය වෙනුවෙන්**

අත්සන : ..........................................
නම : ..........................................................................
ලිපිනය : ..........................................................................
ජාතික හැඳුනුම්පත් අංකය : ..........................................................................
නිල මුද්‍රව

**දෙවන පාර්ශවය වෙනුවෙන්**

අත්සන : ..........................................
නම : ..........................................................................
ලිපිනය : ..........................................................................
ජාතික හැඳුනුම්පත් අංකය : ..........................................................................

**සාක්ෂි :**

1. අත්සන :
   නම :
   ලිපිනය :
   ජාතික හැඳුනුම්පත් අංකය :

2. අත්සන :
   නම :
   ලිපිනය :
   ජාතික හැඳුනුම්පත් අංකය :